**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - 2018**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව කාර්යාංශය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් කාර්යාංශය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ට පටහැනිව, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ලාභයට ගැලපිය යුතු රු.3,003,451 ක විලම්බිත ආදායම් හා රු.2,221,194,662 ක රාජ්‍යභාගවලට අදාල ගැලපීම් සිදුකර නොතිබුණි. මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාම් ලෙස දැක්විය යුතුව තිබුණු රු.1,958,859 ක පාරිතෝෂික ගෙවීම් මුදල් ප්‍රවාහයට එකතු කර තිබුණි. ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු ආපදා අරමුදලට ගෙවීම් රු.5,514,806 ක් හා එම අරමුදලින් ආපසු ගෙවීම් රු.3,572,000 ක් සඳහා ගැලපීම් නොකර එම අගයන් අතර වෙනස වූ රු.1,942,806 ක්, භාණ්ඩාගාර ප්‍රේෂණ රු.1,500,000,000 ක් හා රාජ්‍යභාග රු.2,221,194,662 ක් මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස දක්වා තිබුණි. තවද මුදල් ආයෝජනයක් සිදු නොවුණු රු.148,899,366 ක දේපල පිරියත හා උපකරණ ගැලපීම් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. මෙකී සාවද්‍ය ගැලපීම් අනුව | වරාය නගර ව්‍යාපෘතිය යටතේ රාජ්‍යභාග ලෙස සඳහන් මුදල් මූල්‍යමය ගණුදෙනුවක් නොවන නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අදාල කර ගෙන නැත. විලම්බිත ආදායම් ගැලපීම් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ගලපන ලද්දේ පෙර ලබාදුන් උපදෙස් මතය. පාරිතෝෂික ගෙවීම් යටතේ සඳහන් රු.1,958,859 තුල ඇතුලත් ගෙවා ඇති පාරිතෝෂික මුදල මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස පෙන්වා ඇතත් ඉදිරියේදී එය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ සඳහන් කරනු ලැබේ.<br>මහා භාණ්ඩාගාරයට රාජ්‍යභාග මුදල් ලෙස ගෙවූ රු.1,700,000,000 ක මුදල තුල 2019 වර්ෂයට ගෙවූ රු.200,000,000 මුදල ද තිබූ බැවින් රු.1,500,000,000 ක් මූල්‍ය | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිගත හැකි මට්ටමක නොවුණි. | ක්‍රියාකාරකම් යටතේ ගලපා ඇත. එම මුදල හා රු.148,899,366 මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ඉදිරි වර්ෂවලදී ගැලපීමට ක්‍රියාකරනු ලැබේ. රු.5,514,806 ක මුදල ආයෝජනයක් නොව සේවකයන්ට ලබාදිය යුතුව තිබූ දිරි දීමනා මුදලින් සුභසාධන කටයුතු වලට මාරු කල මුදලකි. එයින් ආපසු ගෙවන ලද රු.3,572,000 ක මුදල හා රු.5,514,806 ක මුදල ද ගලපා ඇත්තේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේය. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කාර්යාංශයට විරුද්ධව බාහිර පාර්ශව විසින් නඩු 28 ක් හා බාහිර පාර්ශවයන්ට විරුද්ධව කාර්යාංශය විසින් නඩු 18 ක් පවරා තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව අදාළ අසම්භාව්‍ය වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | බාහිර පාර්ශවයන් විසින් කාර්යාංශයට විරුද්ධව පවරා ඇති නඩුවල මූල්‍යමය බලපෑමක් ඇතිවන නඩු පමණක් සැලකිල්ලට ගෙන අවශ්‍ය එළිදරව් කිරීම් කර තිබේ. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාංශය උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණද රාජ්‍යභාග ආදායම මුදල් පදනම මත හඳුනාගෙන රු.4,336,254,836 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 34(ආ) සහ 37 ඡේද ප්‍රකාර උපචිත අයහාර හඳුනා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රමිතයේ 39(අ) ඡේදය ප්‍රකාර රාජ්‍යභාග ආදායම හඳුනා ගැනීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර ද නොතිබුණි. | රාජ්‍යභාග ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර නැත. ආදායම් සහ වියදම් ගිණුම්ගත කරනුයේ උපචිත පදනම මතය. කෙසේ වෙතත් රාජ්‍යභාග ආදායම හඳුනාගැනීමේ ක්‍රමවේදයේ අඩුලුහුඩුකම් ඇති බැවින් ලැබිය යුතු රාජ්‍යභාග මුදල් තහවුරු කර ගැනීමට නොහැකි වී තිබේ. | කාර්යාංශයේ ආදායම් හඳුනා ගැනීම සම්බන්ධව හා අනාවරණය කිරීම සම්බන්ධව ගිණුම්කරණ ප්‍රමිතවල සඳහන් නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දැක්විය යුතු භාණ්ඩාගාරයට කළ රාජ්‍යභාග ගෙවීම් රු.200,000,000 ක් කළමනාකරණ තීරණයක් මත ඉදිරියට කළ ගෙවීමක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහ ගණන්දීමේ නිලධාරීගේ සටහන පරිදි සමාලෝචිත වර්ෂයේ මහා භාණ්ඩාගාරයට ගෙවන ලද මුදලින් රු.200,000,000 ක මුදල 2019 වර්ෂයේ ගෙවීමක් ලෙස සලකා කටයුතු කරන ලදි. | වර්ෂයට අදාල වියදම් එම වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පල්ලෙකැලේ සුනාමි සන්නිවේදන මධ්‍යස්ථානය නඩත්තුව සඳහා විදේශ විශ්ව විද්‍යාලයකින් ලැබී, වියදම් දැරීමෙන් පසු ඉතිරිව තිබූ රු.10,703,148 ක මුදලක් ආපසු ගෙවීම පිළිබඳ නිශ්චිත වගකීමක් නොමැතිව ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි. | රු.10,703,148 මුදල ලැබුනේ සුනාමි උපකරණ වල හදිසි වියදම් දැරීමට අත්තිකාරම් මුදලක් ලෙසය. පෙර වර්ෂවල සිට එය ජංගම වගකීමක් ලෙස පෙන්වා ඇත. | මේ සම්බන්ධව නිවැරදි ගිණුම් ප්‍රතිපත්තියක් තෝරාගෙන ඒ අනුව ගිණුම්ගත කිරීමට හා මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කාර්යාංශයට අයත් නොවූ සුභසාධක අරමුදලක පැවති රු.30,052,605 ක ශේෂය වගකීමක් ලෙස හා ඊට අදාල ස්ථාවර තැන්පතු ශේෂය වූ රු.31,731,928 වත්කමක් ලෙස මූල්‍ය වාර්තාවල දක්වා තිබූ අතර ස්ථාවර තැන්පතු පොලිය වූ රු.1,751,819 කාර්යාංශයේ ආදායමක් ලෙස ගෙන තිබුණි. | මෙය අරමුදලක් නොවන බවත් අදාල නිළධාරීන්ගෙන් අයකරගත් මුදලක් පමණක් බවත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී සාකච්ඡා කර ඇත. | භාණ්ඩාගාර අනුමත අරමුදලක් ලෙස පවත්වාගෙන යන්නේ නම් පමණක් කාර්යාංශ ගිණුම්වලට ඇතුලත් කල යුතුය. |

### 1.5.5 ඒකාබද්ධ කිරිම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 66 ක හිමිකමක් කාර්යාංශයට තිබුණද එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමග ඒකබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමේ මූල්‍ය ප්‍රකාශන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමග ඒකාබද්ධකර ගැනීමට නොහැකි වූ කරුණු අවසන් ගිණුම් වාර්තාවේ සඳහන් කර ඇත . | සියයට 66 ක හිමිකමක් කාර්යාංශයට ඇති බැවින් පැන නැගී ඇති නීතිමය කරුණු කඩිනමින් විසඳාගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ආදායම් බදු | 32,617,607 | ආදායම් බදු ගණනයේදී බදු බැර ලෙස අඩුකර තිබූ රඳවාගැනීම් බදු ගෙවීම් වලට අදාල තහවුරු කිරීම් | රඳවාගැනීමේ බදු තහවුරු වන පරිදි සියලුම ලියවිලි කාර්යාංශය ගනුදෙනු කරන බැංකුවලින් ලබා ගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රඳවා ගැනීම් බදුවලට අදාල තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත | | | |
| | (i) 26(1) හා 44(ආ) වගන්ති | 1. රජය වෙනුවෙන් කාර්යාංශය අයකරගත් රාජ්‍යභාග භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අයකරගෙන තිබූ රු.4,326,254,835 ක රාජ්‍යභාගවලින් රු.605,060,173 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණි. ඉකුත් වර්ෂ 4 ට අදාලව මෙලෙස රඳවාගෙන තිබූ රාජ්‍යභාග මුදල්වල එකතුව රු.1,530,541,421 ක් විය | පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතට අනුකූලව කාර්යාංශය කටයුතු කරයි. එහිදී කාර්යාංශයට අරමුදල් පවත්වා ගත හැකි අතර, කාර්යාංශයේ වියදම් එමගින් පියවා ගැනීමට බලතල ඇත. කෙසේ වෙතත් කාර්යාංශය සෑම වසරකම භාණ්ඩාගාරය වෙත අතිරික්ත මුදල් යැවීම සිදුකරයි. | රාජ්‍යභාග මුදල් භාන්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. අරමුදල් පවත්වා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ නිශ්චිත අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2. අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල බලපත්‍රලාභීන් 4 දෙනෙකු විසින් අනුමත සීමාව ඉක්මවා කැණීම් කර තිබූ කළුගල් කියුබ් 31,772 ක් සඳහා අයවිය යුතු රාජ්‍යභාග රු.1,906,320 ක් අයකර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව සොයා බලා අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | අදාල රාජ්‍යභාග මුදල් අයකර ගැනීමේ කටයුතු විධිමත් ක්‍රියා පිළිවෙතකට අනුව හා කාර්යක්ෂමව සිදුකළ යුතුය. |
| (ii) 28(4) වගන්තිය | කළුගල් නිෂ්පාදන ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. | කළුගල් නිෂ්පාදන ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් මේ වන විට සකස් කරමින් පවතී. | කළුගල් ප්‍රවාහනය අනීතිකව සිදුකිරීම වළක්වා ගැනීම සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කල යුතුය. |
| (iii) 52(2) වගන්තිය හා 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට් පත්‍රය මගින් සංශෝධිත 21(අ) වැනි පතල් හා කැණීම් නියෝගය | කැණීම්වලින් අනතුරුව මාස 3 සිට වර්ෂ 5 ක් දක්වා කාලය තුල ඉඩම් පුනරුත්ථාපනය කරවීමට කටයුතු නොකළ කාර්මික කැණීම් බලපත්‍රලාභීන් 874 කගෙන් ලබාගෙන තිබූ වටිනාකම රු.101,955,175 ක් වූ බැංකු ඇපකර මුදල් කර ගෙන ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | මේ වන විට පුනරුත්ථාපනය නොකරන ලද වලවල් වෙනුවෙන් කාර්යාංශය වෙත තබා ඇති බැංකු ඇපකර අත්පත් කර ගැනීමට කටයුතු කර ඇති අතර, ඔවුනට විරුද්ධව නීතිමය කටයුතු කිරීමට ක්‍රමවේදයක් සකස් කරමින් පවතී. | විධිවිධාන ප්‍රකාරව පුනරුත්ථාපන කටයුතු සිදුකිරීමට කටයුතු කල යුතුය. |
| (iv) 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරන ලද 33 (4) වැනි පතල් හා කැණීම් නියෝගය | පතල් නිෂ්පාදනවල නිශ්චය කල වෙළඳ වටිනාකම, ඉඩදිය හැකි අඩු කිරීම් හා රාජ්‍ය භාග ගෙවීම් වැඩපිළිවෙල සඳහා ලේකම්වරයා වෙත නිර්දේශ ඉදිරිපත් කර කාලීන සංශෝධනයන් සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි. | අදාල සංශෝධනයන් සිදුකිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. | පනතේ නියමයන්ට අනුව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 6.2 (අ) ඡේදය | පනත ප්‍රකාරව මාස ½ ක වැටුප මත පාරිතෝෂික ගණනය කල යුතු වුවද සම්පූර්ණ මාසයක වැටුප මත ගණනය කිරීම හේතුවෙන් නිලධාරීන් 18 කට රු.7,296,846 ක් වැඩිපුර ගෙවා තිබූ අතර රු.81,445,551 ක් වැඩිපුර පාරිතෝෂික ප්‍රතිපාදනය කර ද තිබුණි. රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් දැනුම් දී ඇති පරිදි වැඩිපුර ගෙවන ලද රු.6,317,415 ක් වූ පාරිතෝෂික ආපසු අයකර ගැනීමටද, කටයුතු කර නොතිබුණි. | අදාල ගෙවීම් සිදුකර ඇත්තේ පාරිතෝෂික පනත ප්‍රකාරව වන අතර වැඩිපුර ගෙවීමක් සිදුව නැත. | පනතේ විධිවිධාන ප්‍රකාරව හා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගය පරිදි පාරිතෝෂික වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට හා පාරිතෝෂික ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(2) | භාණ්ඩාගාර අනුමැතිය ලබානොගෙන රු.35,000 සිට රු.165,000 දක්වා වූ එකතුව රු.1,035,000 ක සුලු මුදල් අග්‍රිම 15ක් හා රු.40,000 සිට රු.105,000 දක්වා වූ එකතුව රු.890,000 ක ඉන්ධන අත්තිකාරම් 15ක් ප්‍රාදේශීය කාර්යාලවලට ලබාදී තිබුණි. | අග්‍රිම සීමාවන් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| **(ii)** | මුදල් රෙගුලාසි 371(5) | 1. සමාලෝචිත වර්ෂය අවසානයේ නොපියවූ එකතුව රු.10,271,083 ක් වූ උප අග්‍රිම ශේෂ පියවා ගැනීමට කටයුතු නොකර රු.9,070,105 ක් වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ වශයෙන් හා රු.1,200,978 ක් මුදල් සහ මුදල් සමාන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ප්‍රාදේශීය කාර්යාල වලට ලබාදී ඇති අතුරු අග්‍රිම වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන්ම පියවීමට උපදෙස් දී ඇත. | වර්ෂය අවසානයේ සියලු උප අග්‍රිම පියවීමට කටයුතු කල යුතුය. |
| | | 2. කාර්යාංශයේ හිටපු සභාපතිවරයෙකු වෙත 2014 වර්ෂයේදී ලබා දී තිබූ රු.1,500,000 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබූ අතර අදාල අත්තිකාරමෙන් බලාපොරොත්තු වූ කාර්ය ඉටුකළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | වර්ෂය අවසානයේ සියලු උප අග්‍රිම පියවීමට කටයුතු කල යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 760 හා 757(2) | භාණ්ඩ සමීක්ෂණය මගින් විදුලි උපකරණ වර්ග 88 කට අදාල ඒකක 864 ක් ඌනතා ලෙස හඳුනාගෙන තිබූ අතර උපකරණ ඉවත් කලයුතු බවට අදාල උපකරණ | පිළිතුරු ලබාදී නැත. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු ස්වාධීන සමීක්ෂණ මණ්ඩල මගින් සිදුකල යුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | භාවිතා කරනු ලබන නිලධාරීන්ද ඇතුලත් සමීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර තිබුණි. මෙම ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කරද නොතිබුණි. | | අතර ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ<br>------------------- | | | |
| | (i) 8.3.3 ඡේදය | ගෙවිය යුතු උපරිම දිරිදීමනාව/ප්‍රසාද දීමනාව මාස 2 ක දළ වැටුප වුවත් ඊට පටහැනිව මාස 9.6 ක වැටුපට සමාන දිරිදීමනාවක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සේවකයන්ට ගෙවා තිබුණි. | පීඊඩී/12 හි දක්වා ඇත්තේ දිරිදීමනා පිළිබඳව නොව ප්‍රසාද දීමනා පිළිබඳවය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දිරි දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය. |
| | (ii) 6.5.3 ඡේදය | 2015 සිට 2017 දක්වා වර්ෂවල වාර්ෂික වාර්තා 2019 අප්‍රේල් 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2015 හා 2016 වාර්ෂික වාර්තා මේ වන විට අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2003 ඔක්තෝබර් 28 දිනැති අංක පීඊඩී 17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව විදේශ සංචාර 4 ක් සඳහා නිලධාරීන් 19 ක් සහභාගී කරවා තිබුණි. | කාර්යාංශය විසින් අදාල අනුමැතීන් ලබාගෙන ඇත . | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත අනුමැතිය සහිතව මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක PED/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වර්ෂයේ අයවැය මගින් 2018 සංයුක්ත සමාජීය වගකීම් (CSR) වැඩසටහන් සඳහා සඳහා මුදල් ප්‍රතිපාදනය කර නොතිබියදී, පිළිගත හැකි ඇස්තමේන්තුවක් ද ලබා නොගෙන ත්‍රිකුණාමලය ගෝමරන්කඩවල රන්ගිරි උල්පත රජමහා විහාරයේ ධර්මශාලාවේ වහලය ඉදිකිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය මත රු.4,500,000 ක මුදලක් ලබාදී තිබුණි . | සංයුක්ත සමාජීය වගකීම් වියදම අනෙකුත් වියදම් වල ඇතුලත් කර ඇත. ස්ථානීය පරීක්ෂණ කමිටු නිලධාරීන් ඉදිරිපත් කල වාර්තාවේ වැය වන මුදල රු.මිලියන 46 ක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

**1.7** **බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 11 දින සිට කාර්යාංශය ආදායම් බදු වගකීමට බැඳුනද ආදායම් බදු ගණනය කිරීමේදී 2018 ජනවාරි සිට ගණනය කිරීම හේතුවෙන් ආදායම් බදු වියදම හා බදු වගකීම රු.22,459,000 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු වියදම ගණනය කිරීමේදී විලම්බිත බදු සලකා බලා නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවලට ඊට අදාල ගැලපීම් සිදුකරද නොතිබුණි. | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් දැනුම් දෙන ලද්දේ වර්ෂයට අදාල බදු ගණනය කිරීමේදී බද්දට අදාල වියදම් සියල්ල එම වර්ෂයට ගණනය කර අඩු කිරීමට ඉඩ දෙන බවය. එබැවින් බදු ගණනයේදී බදු වැඩියෙන් දැක්වීමක් සිදුවී නොතිබුණි.<br>විලම්භිත බදු වගකීම සලකා බලා තිබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් බදු ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු 391,019,540.ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.686,578,905 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.295,559,365 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රාජ්‍යභාග ආදායම් රු.289,770,482 කින් සහ බලපත්‍ර ගාස්තු ආදායම් රු.93,639,019 කින්, අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **අනාර්ථික ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාපතිවරයා රාජකාරී සංචාරයකට ඉන්දියාවට යැමේදී ගුවන්යානයේ පිරිමැසුම්දායී පන්තිය වෙනුවට ව්‍යාපාර පන්තියේ ගමන් කර තිබීම හේතුවෙන් ප්‍රවේශපත්‍ර වෙනුවෙන් රු.52,800 ක් වැඩිපුර වැයකර තිබුණි. | සොයා බලා පසුව දැනුම් දීමට බලාපොරොත්තු වෙමි. | වැඩිපුර වැයකල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | සභාපතිවරයා එක්සත් රාජධානියේ පැවති එක් දින රාජකාරී සාකච්ඡාවක් සඳහා සහභාගී වී තිබූ අතර දින 7 කට සංයුක්ත දීමනා හා අනියම් දීමනා ගෙවීම හේතුවෙන් දින 4 ක් සඳහා එකතුව රු.375,100 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ආපසු පැමිණීමේ ගුවන් යානයේ වෙලාව සලකා දින 7 කට දීමනා ගෙවන ලදි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අනුරාධපුර මිහිඳු ආරණ්‍ය සේනාසනයේ රු.1,851,920 ක වියදමින් ප්‍රවිත්‍රීකරණ ජල පද්ධතියක් ස්ථාපිත කිරීමේදී සමරු ඵලකයක් සඳහා රු.6,500 ක්ද වැයකර තිබුණි. එසේ තිබියදී ස්වාභාවික ගල් පුවරු සමරු ඵලකයක් මහරගම ප්‍රදේශයේ සිට ප්‍රවාහනය කර සවිකර ගැනීම සඳහා රු.775,000 ක් අමතරව වැයකර තිබුණු අතර ඊට භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ජල පද්ධතිය විවෘත කිරීම සඳහා ස්වාභාවික ගල් පුවරුවක් සවිකිරීමට අදාල වියදම ද ඇතුලුව මුලු වියදම වූ රු.මිලියන 25 ක මුදල සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන තිබුණි. | අවශ්‍ය වියදම් සඳහා පමණක් අනුමැතිය මත වියදම් දැරිය යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත බලගැන්වීමේ බලතල කාර්යාංශය වෙත පැවරී තිබුණද පනත උල්ලංඝනය කිරීම් සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. | මේ වන විට කාර්යාංශයේ නීති අංශයට අනුබද්ධිත වැටලීම් අංශයක් ස්ථාපිතව ඇති අතර, නිති උල්ලංගනය කිරීම් සම්බන්ධ වැටලීම්වලට අදාලව නීතිමය කටයුතු කරන ලදි. 2018 වර්ෂයේ නීති උල්ලංගනය කිරීම් 9000 කට අධික ප්‍රමාණයක් සඳහා වැටලීම් සිදුකර නඩු පවරා ඇති බව පොලිස් දෙපාර්තමේන්තුව වාර්තා කර ඇත. | පනත උල්ලංඝනය සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 මැයි 22 දින අමාත්‍ය මණ්ඩලය විසින් සිදුකල දැනුම්දීම ප්‍රකාරව ඛණිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කාර්යාංශය විගණිත දින දක්වා පියවර ගෙන නොතිබුණි. | අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම්දීම ප්‍රකාරව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර මේ වන විට අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 අප්‍රේල් 05 දිනැති අංක අමප/17/0629/704/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තිරුවානා උපරිම වශයෙන් අගය එකතු කිරීමෙන් පසුව අපනයනය කල යුතු වුවත් දිස්ත්‍රික්ක 9 ක පුද්ගලයන් 29 ක් වෙත නිකුත් කර තිබු කැණීම් බලපත්‍ර මත කැණීම් කරනු ලබන තිරුවානා අගය එකතු කිරීමකින් තොරව අපනයනය කරමින් පැවතුණි. එසේම වැල්ලවාය කොටිකම්බොක්ක ප්‍රදේශයේ තිරුවානා කැණීම් කිරීමට ලබාදී තිබු බලපත්‍ර 3 කින් කැණීම් කල හැකි ප්‍රමාණය ඉක්මවා කියුබ් 10,914 ක් කැණීම් කර තිබු අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමිය හා ඊට යාබද පුද්ගලික ඉඩමකින් කැණීම් කරගත් තිරුවානා කියුබ් 22,094 ක් වෙනුවෙන් අයවිය යුතු රාජ්‍යභාග මුදල බලපත්‍රලාභීන්ගෙන් අයකරගෙන නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අගය එකතු කිරීමෙන් තොරව තිරුවානා ඛණිජය අපනයනය කිරීමට අවසර දෙනු නොලැබේ. කැනිම් බලපත්‍රලාභීන් විසින් තිරුවානා අපනයනය නොකරන අතර වෙළඳ බලපත්‍ර හිමි අපනයනකරුවන් මෙම තිරුවානා මිලදී ගෙන නියමිත අගය එකතු කිරීමෙන් අනතුරුව ඛනිජ ආයෝජන ගිවිසුම ප්‍රකාරව අපනයන කරනු ලැබේ. වැල්ලවාය කොටිකම්බොක්ක ප්‍රදේශයේ තිරුවානා කැණීම් කිරීමට ලබාදී තිබු බලපත්‍ර මත කැණීම් කල තිරුවානා අපනයනය කරනු ලබන සමාගම වෙත අලවි කර ඇති අතර, පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත අනුව ඊට අදාල රාජ්‍යභාගය අයකර ගෙන අපනයනය කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | යාන්ඔය වැලි නිධියේ වැලි කැණීම් සිදුකල කැණීම්කරුවන් කැණීම් බලපත්‍රවල සඳහන් කොන්දේසි උල්ලංඝනය කරමින් සිදුකර තිබුණු පරිසර හානිය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා භාවිතා කල පස් කියුබ් 1,343,810 ක් වෙනුවෙන් රු.26,876,200 ක් ද, වැලි කියුබ් 3,397 ක් සඳහා රු.543,490 ක්ද ලෙස එකතුව රු.27,419,690 ක් වූ රාජ්‍යභාග අදාල කොන්ත්‍රාත් සමාගමෙන් අයකර ගෙනද නොතිබුණි. | වැලි ඉවත් කිරීමේ බලපත්‍රවලට අදාලව කැනීම් භූමි ප්‍රතිසංස්කරණය සඳහා බැංකු ඇපකර ලබාගෙන ඇත. මේ සම්බන්ධව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ගේ මූලිකත්වයෙන් ඊට අදාල ආයතන සහභාගී කර ගනිමින් මෙම කැණීම් භූමි ප්‍රතිසංස්කරණයට අදාලව ගත යුතු ක්‍රියාමාර්ග දැනුවත් කරන ලදි. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා භාවිත කරනු ලබන ගල් වැලි සඳහා දැනටමත් රාජ්‍යභාග අයකර ගැනීමට කටයුතු කර ඇත. | බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර ඇති බලපත්‍රලාභීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට හා හිඟ රාජ්‍යභාග අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුගල් කැණීම් ප්‍රමාණය ගණනය කිරීමට විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. 2011 වර්ෂයේ අභ්‍යන්තර චක්‍රලේඛයක් පදනම් කරගෙන වෙළඳ මිල රු.1,500 ලෙස සලකා රාජ්‍යභාග ගණනය කර තිබුණු අතර වර්තමානයට ගැලපෙන පරිදි වෙළඳ මිල වෙනස් කිරීමට කටයුතු කර නොතිබුණි. කළුගල් කැණීම් සම්බන්ධව බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් පොළව අභ්‍යන්තරයට කැණීම් කිරීම, කැණීම් අවසානයේ භූමි ප්‍රතිසංස්කරණය නොකිරීම, බලපත්‍ර රහිතව කැණීම් කිරීම, පරිසර ප්‍රතිසංස්කරණය සඳහා ඇප බැඳුම්කරයක් හෝ ඇප මුදලක් ලබා නොගැනීම, අනුමැතිය ලබාගත යුතු ආයතනවලින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකිරීම, කැණීම් කල සත්‍ය ප්‍රමාණයට රාජ්‍යභාග අයකර නොගැනීම යන අඩුපාඩු නිරීක්ෂණය වුවද ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට මොරටුව විශ්ව විද්‍යාලයේද උපදෙස් ලබාගෙන කළුගල් ඇතුලු සියලු ඛණිජ කැණීම් කර ඉවත් කරනු ලබන කියුබ් ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේදයක් සකස් කරමින් පවතී. අනෙකුත් කරුණු සඳහා පිළිතුරු ලබාදී නැත. | වෙළඳ මිල යාවත්කාලීන කිරීමට, සත්‍ය කැණීම් ප්‍රමාණයට රාජ්‍යභාග අයකර ගැනීමට, බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හා පරිසර ප්‍රතිසංස්කරණයට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | දිරිදීමනා ගෙවීමට කාර්යසාධනය පදනම් වූ ක්‍රමවේදයක් අනුමත කරගෙන නොතිබූ අතර ඛණිජ ගවේෂණ ආදායම් පදනම් කරගෙන දිරිදීමනා ගෙවිය යුතු වුවත් රු.12,678,745 ක ක්ෂේත්‍ර පරීක්ෂණ ආදායම් හා රු.5,487,000 ක පරීක්ෂණ පිපුරුම් (Test Blast) ආදායම් ද පදනම් කරගෙන රු.110,166,984 ක දිරිදීමනා ගෙවා තිබුණි. ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමෙන් කාර්යාංශයට අනුයුක්ත කර තිබූ සේවකයන් 99 දෙනෙකුටද රු.9,588,514 ක දිරිදීමනා ගෙවා තිබුණි. | 2017 වර්ෂයේ ආදායම ලෙස ගෙන ඇති ක්ෂේත්‍ර පරීක්ෂණ ආදායම බලපත්‍ර ලබාදීම සඳහාම පමණක් ලද ආදායමක් නොවන අතර, මෙය ඛණිජ ගවේෂණ සඳහා ලද ආදායමක් වේ. මේ අනුව පරීක්ෂණ පිපුරුම් ගාස්තු ද ඛණිජ ගවේෂන කටයුත්තක් සඳහා කරනු ලබන්නකි. | දිරිදීමනා ගෙවීමේදී අනුමත ආදායම් පමණක් සැලකිල්ලට ගත යුතු වන අතර භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන ගෙවීම් කල යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඛනිජ නිධිවල ධාරිතාවය මැනීම සඳහා 2016 වර්ෂයේදී රු.795,000 කට මිලදී ගත් විද්‍යුත් දුර මැණීම් උපකරණයක් භාවිතයට නොගෙන වසර 2 ක් තිස්සේ නිශ්කාර්යව තිබුණි. | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මට ප්‍රාග්ධන නොවන භාණ්ඩ සැපයුම් හා සේවා ප්‍රසම්පාදනයන් ඇතුලත් කර නොතිබු අතර අයවැයට අනුකූල වන ආකාරයට ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. ප්‍රසම්පාදන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර නොතිබුණු අතර ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර ද නොතිබුණි. මෙකී අනුමත නොකළ ප්‍රසම්පාදන සැලසුම්ද ඉක්මවා පරිගණක 94 ක්, මුද්‍රණ යන්ත්‍ර 77 ක් හා ලැප්ටොප් පරිගණක 48 ක් මිලදී ගැනීමට රු.18,027,184 ක් වැයකර තිබුණි. | 2019 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්මට ප්‍රාග්ධන නොවන භාන්ඩ සැපයුම් හා සේවා ප්‍රසම්පාදනයන් ඇතුලත් කර ඇත.<br>මහජනතාවගේ සේවාවන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා 2018 වර්ෂය තුල සේවා අවශ්‍යතා සඳහා පරිගණක ගැනීමට සිදුවිය. සේවා අවශ්‍යතාව හා ඒකක පිරිවැය සාපේක්ෂව අඩුවීම මත මුද්‍රණ යන්ත්‍ර මිලදී ගෙන ඇත. 2018 වර්ෂයේ බඳවා ගන්නා ලද නව නිලධාරීන් සඳහා සහ ක්ෂේත්‍ර රාජකාරීවල නියැලෙන නිලධාරීන්ගේ සේවාවන් කාර්යක්ෂමව සිදුකිරීමට ලැප්ටොප් පරිගණක මිලදී ගෙන ඇත. | සියලුම ප්‍රසම්පාදනයන් ඇතුලත්ව ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කර ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු ඉටු කල යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තනතුරු 25 ක් සඳහා කොන්ත්‍රාත් හා කාර්ය පැවරුම් පදනම මත සේවකයන් 248 ක් අදාල අනුමැතීන් ලබා ගැනීමකින් තොරව බඳවාගෙන තිබු අතර ඉන් තනතුරු 17 ක් අනුමත කාර්ය මණ්ඩල තනතුරු නොවීය. | භූ විද්‍යාඥ, භූ භෞතික විද්‍යාඥ තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමට මේ වන විට අයදුම්පත් කැඳවා ඇත. හදිසි සේවා අවශ්‍යතාවය අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද සහිතව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සිදු විය. | අනුමත කාර්යමණ්ඩල සැලැස්ම අනුව බඳවාගැනීම් සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට කාර්යාංශයේ පැවති පුරප්පාඩු 87 ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර භූ විද්‍යා අංශයේ තනතුරු 8 කට අදාල අනුමත සේවක සංඛ්‍යාව 11 ක් පුරප්පාඩුව පැවතුණි. කැණීම් ඉංජිනේරු තනතුර හා සිතියම් ශිල්පී තනතුරු සඳහා බඳවා ගන්නා ලද නිලධාරීන්ට අවශ්‍ය මූලික සුදුසුකම් නොවුණි. බඳවා ගන්නා ලද ස්ථිර සේවකයන් 11 දෙනෙකුගේ පත්වීම් පෙරදාතම් කර තිබුණද ඊට හේතු නිරීක්ෂණය නොවූ අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට පෙර දිනයක් දක්වා පෙරදාතම් කල අවස්ථාද විය. එසේම කාර්යාංශයේ අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා ලේඛකාධිකාරී තනතුරු 2 ක් ද, කළමනාකරණ සහකාර තනතුරු 32 ක් හා කැණීම් ඉංජිනේරු තනතුරු 4 ක් පුරප්පාඩුව තිබියදී, කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 20 දෙනෙකු ද බඳවාගෙන තිබුණි. | සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීම සඳහා සැලකිය යුතු කාලයක් ගතව ඇත. අභ්‍යන්තර උසස්වීම් සඳහා හිමිකම් තිබූ නිලධාරීන්ට මෙම ප්‍රමාදය නිසා අසාධාරණයක් විය. ඒ අනුව මෙලෙස සම්මුඛ පරීක්ෂන දිනය සිට එම පත්වීම් ලබාදීම තුලින් ඔවුන් හට යම් සහනයක් හිමිවිය. මෙම අය අභ්‍යන්තර සේවයේ යෙදී සිටි අය බැවින් එලෙස එම දිනයේ සිට පත්වීම් ලබාදී ඇති අතර, කාර්යාංශයේ ආරම්භයේ සිටම මෙවැනි අවස්ථාවලදී එම ක්‍රමය අනුගමනය කර ඇත. මෙම තනතුරු සඳහා කාර්යාංශයේ අවශ්‍යතාවයක් තිබුණු බැවින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සිදුවිය. | පුරප්පාඩු වහාම පිරවීමටත්, භාණ්ඩාගාර අනුමැතිය මත පමණක් සේවකයින් බඳවා ගැනීමට හා අවශ්‍ය සුදුසුකම් සපිරූ නිලධාරීන් පමණක් බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2000 ජූලි 19 දිනැති අංක 12/2000 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පුහුණුවන්නන් සඳහා වගකිව යුතු රාජකාරී නොපැවරිය යුතු වුවද ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල කාර්යාලීය රාජකාරී කටයුතු වල පුහුණුවන්නන් 149 ක් සේවයේ යොදවා තිබුණි | ප්‍රමාණවත් ස්ථිර කාර්යය මණ්ඩලයක් නොමැති බැවින් ස්ථිර නොවන අය සඳහා ද යම් යම් වගකීම් පැවරීමට සිදුව ඇත. ඉදිරියේදී ස්ථිර කාර්ය මන්ඩලය වැඩිකර ගත් පසු මෙම තත්ත්වය මඟහැරෙනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |